සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

07 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 11 | S

# බුද්ධ ධර්මය

කාලය පැය දෙකයි

නම / විභාග අංකය

සැලකිය යුතුයි : ★ පළමු කොටසේ සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
★ දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

## I - කොටස

01) සත් සතිය ගත කිරීමේදී බුද්ධ ශරීරයෙන් බුදුරුස් විහිදෙන්නට පටන් ගත් සතිය වනුයේ ,
i) පළමු සතිය. ii) තෙවන සතිය. iii) සිව්වන සතිය. iv) පස්වන සතිය.

02) බුදු සසුනේ ද්වේවාචික උපාසකයන් වූයේ ,
i) අනේපිඬු සිටුතුමා. ii) තපස්සු භල්ලුක. iii) බිම්බිසාර මහරජු iv) කොසොල් රජු

03) බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ ලෝකයාට ධර්මය දේශනා කරන ලෙස ආරාධනා කළේ,
i) සහම්පති මහා බ්‍රහ්මයා. ii) සොත්ථිය බමුණා.
iii) සංජය පරිබ්‍රාජකයා. iv) කොණ්ඩඤ්ඤ තවුසා.

04) පස්වග මහණුන් රහත් වූයේ , කුමන සූත්‍රය ඇසීමෙන්ද?
i) දම්සක් පැවතුම් සූත්‍රය. ii) පරාභව සූත්‍රය.
iii) අනත්ත ලක්ඛණ සූත්‍රය. iv) මහා මංගල සූත්‍රය.

05) යසකුල පුත්‍රයාගේ හොඳම මිතුරෙකි ,
i) ගවම්පති. ii) සුනීත. iii) භද්දිය. iv) උපක.

★ අංක 06 සිට 10 දක්වා ප්‍රකාශවලට අදාළ පිළිතුර හරි නම් ( ✓ ) සළකුණ ද වැරදි නම් ( X ) සළකුණ ද යොදන්න.

06) බුදු සසුනේ ප්‍රථම සංඝ සන්නිපාතය සඳහා සහභාගි වූ භික්ෂු ශ්‍රාවකයෝ අතර සැරියුත් මුගලන් දෙනමද ඇතුළත් විය (...........).

07) බුදු සසුනේ ප්‍රථමයෙන් සෝවාන් වූ රජු කොසොල් රජුය (...........).

08) සෝපාක යනු බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලැබූ අසරණයෙකි (...........).

09) ගිලනුන්ට උපස්ථාන කිරීම මහත් අකුසල ක්‍රියාවකි (...........).

10) යහපත් ගමන් ඇති හෙයින් බුදුරජාණන් වහන්සේ සුගත නම් වන සේක (...........).

★ අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

11) මෙත් වඩන්නකු තුළ තිබිය යුතු උසස් ගුණාංග 15 ක් ඇතුළත් වන්නේ .......................................... සූත්‍රයේය.

12) බුදුරජාණන් වහන්සේ හා සුදත්ත සිටුවරයා මුලින්ම .......................................... දී හමුවිය.

13) බුදු දහම උඩුගං බලා යාමට මඟ පෙන්වන හෙවත් .......................................... දහමකි.

14) ගිහියාගේ නිත්‍ය සීලය .......................................... නම් වේ.

15) ගුරුවරයාගෙන් ශිෂ්‍යයා වෙත ලබාදෙන යුතුකමක් ලෙස .......................................... දැක්විය හැකිය.

( පංචශීලය , අෂ්ඨාංග ශීලය , පටිසෝතගාමී , සීත වනයේ , අනුසෝතගාමී , මහා මංගල සූත්‍රය , යහළු මිත්‍රාදීන්ට හඳුන්වා දීම, කරණීය මෙත්ත සූත්‍රය )



LIVEWORKSHEETS

**⋆ අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා 'A' කොටසට ගැළපෙන පිළිතුර 'B' කොටසින් තෝරා යා කරන්න.**

| | | | |
|---|---|---|---|
| 16) | නිවැරදි නායකත්වය | i | මංගල කරුණාකි |
| 17) | දස පුණ්‍ය ක්‍රියා | ii | ධම්ම නියාමය |
| 18) | " සිංහලයා ඉතා විනීතය " | iii | අපණ්ණක ජාතකය |
| 19) | ඉවසීම | iv | වෘද්ධාපචායනය |
| 20) | දරුවකු තරුණයකු වීම | v | රොබට් නොක්ස් |



LIVEWORKSHEETS